සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

0831

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2025 (ඔක්තෝබර්)
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2025 (ஒக்டோபர்) / Grade 13 Final Term Test - 2025 (October)

භූගෝල විද්‍යාව	22	S	I	කාලය நேரம் Time	පැය 03 යි.

නම் பெயர் Name ..... විභාග අංකය සුට්ටෙණ්ණම් Index No. .....

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. කොටස බහුවර්ණ ප්‍රශ්න 40කින් සමන්විත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 1 බැගින් හිමි වේ.
- II කොටසේ ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය.
- III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- I, II සහ III කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

I කොටස

- **එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති කිත් ඉරි මත ලියන්න.**

1. පහත සඳහන් සිතියම් පරිමාණයන්ගෙන් කුඩා ම සිතියම් පරිමාණය ඇතුළත් වරණය වන්නේ,
   (1) 1: 100, 000 වේ. (2) 1: 75,000 වේ.
   (3) 1: 50,000 වේ. (4) 1: 25,000 වේ.
   (5) 1: 10,000 වේ. (.....)

2. නේමා සිතියමක ලක්ෂණයක් අඩංගු වරණය නොවන්නේ,
   (1) සාපේක්ෂව කුඩා සිතියමක් වීම.
   (2) සිතයම් පරිමාණ ශ්‍රේණියක් මත නිර්මාණය වීම.
   (3) මාතෘකාව නිරූපණය කරන විචල්‍ය මත නිරණය වීම.
   (4) නිර්මාණය ක්‍රමවේදයේ වෙනස්කම් මත වර්ග කිහිපයක් පැවතීම.
   (5) නිරූපණය කරන විචල්‍ය මත සම්මත වර්ණ හා සංකේත වෙනස් කළ හැකි වීම. (.....)

3. සැබෑ භූමියේ $16km^2$ කින් ආවරණය වන ළඳු කැලෑ භූමියක් සිතියමක් මගින් $64cm^2$ කින් ඇඳ දක්වා ඇත්නම් එම සිතියම අඳින ලද පරිමාණය වන්නේ,
   (1) 1: 200, 000 වේ. (2) 1: 100,000 වේ.
   (3) 1: 50,000 වේ. (4) 1: 25,000 වේ.
   (5) 1: 10,000 වේ. (.....)

4. 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් සූචකයේ සංචාරක තොරතුරු ශීර්ෂයට පමණක් අඩංගු ලක්ෂණ ඇතුළත් වරණය කුමක්ද?
   (1) හෝටලය හා සංචාරක බංගලාව වේ. (2) රක්ෂිත මායිම් හා සංචාරක බංගලාව වේ.
   (3) තානායම හා ඓතිහාසික ස්ථානය වේ. (4) තානායම හා දුම්රිය නැවතුම වේ.
   (5) ඓතිහාසික ස්ථාන හා ත්‍රිකෝණමිතික ස්ථාන වේ. (.....)

5. 2025 වර්ෂයේ පළමු මාස හය තුළ මොටර් රථ ආනයන සංයුතිය නිරූපණය කිරීමට වඩාත් සුදුසු ම ප්‍රස්තාරික ක්‍රමවේදය වන්නේ,
(1) සරළ රේඛීය ප්‍රස්තාරය වේ.
(2) බහු රේඛා ප්‍රස්තාරය වේ.
(3) ද්විත්ව තීරු ප්‍රස්තාරය වේ.
(4) බහු තීරු ප්‍රස්තාරය වේ.
(5) අපගමන ප්‍රස්තාරය වේ. (.....)

6. භූගෝලීය දත්ත පද්ධතියේ (GIS) අඩංගු ප්‍රධාන දත්ත ආකෘති දෙක වන්නේ,
(1) අවකාශීය හා අවකාශීය නොවන දත්ත වේ.
(2) දෛශික හා සිවිරැස් වේ.
(3) ජාතික හා ගෝලීය බණ්ඩාංක වේ.
(4) උන්නතාංශය හා බණ්ඩාංක වේ.
(5) ද්විමාන හා ත්‍රිමාණ (3D) වේ. (.....)

7. පහත සඳහන් විචල්‍යය අතුරින් විවික්ත දත්ත පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) ලෝක ජන සංඛ්‍යාව හා නාගරීකරණ සිඝ්‍රතාවය වේ.
(2) උපත් අනුපාතිය හා සංක්‍රමණ ජන සංඛ්‍යා ප්‍රමාණය වේ.
(3) ලෝකයේ ප්‍රධාන නගර ප්‍රමාණය සහ නිවාස සංඛ්‍යාව වේ.
(4) ශ්‍රී ලංකාවේ වාර්ෂික උෂ්ණත්වය හා දුම්රිය මාර්ග පරිපථයේ දිග වේ.
(5) පසෙහි PH $^{+1}$ අගය හා වගාවට යොදා ගන්නා වැව් සංඛ්‍යාව වේ. (.....)

8. ද්විතියික දත්ත රැස් කිරීමේ ක්‍රම දෙකක් ඇතුළත් වරණය වන්නේ,
(1) පර්යේෂණ ලිපි හා ප්‍රශ්නාවලි වේ.
(2) ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා වේ.
(3) මිණුම් හා නිරීක්ෂණ වේ.
(4) සෘජු නිරීක්ෂණ හා සහභාගිත්ව නිරීක්ෂණ වේ.
(5) පුස්තකාල හා අන්තර්ජාල පරිහරණය වේ. (.....)

9. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියෙහි (GPS) චන්ද්‍රිකා පෘථිවිය වටා එක් කක්ෂතලයක් සම්පූර්ණ කිරීමට ගත වන කාලය වන්නේ,
(1) පැය 04 කි. (2) පැය 06 කි. (3) පැය 8කි. (4) පැය 12 කි. (5) පැය 24 කි.
(.....)

10. උපකල්පිත මධ්‍යන්‍ය ඇසුරින් මධ්‍යන්‍ය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන $x = x_0 + \frac{(\Sigma fd)}{n}c$ යන සූත්‍රයෙහි C අක්ෂරය මගින් අදහස් කරනුයේ,
(1) සංඛ්‍යාතය වේ.
(2) දත්ත සංඛ්‍යාතය වේ.
(3) පන්ති ප්‍රාන්තරයේ තරම වේ.
(4) උපකල්පිත මධ්‍යන්‍යය ඇති පන්තියේ මධ්‍යය අගය වේ.
(5) උපකල්පිත මධ්‍යන්‍යයට ඇති පන්තියේ සිට අපගමනය වේ. (.....)

11. භූගෝල විද්‍යාව යන්න පිළිබඳ වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) මානව හා භෞතික ප්‍රපංචයන්වල ස්වභාවය දෘෂ්‍ය ලෙස දැක්වීමේ විෂය වේ.
(2) අවකාශීය විවිධත්වයයේ ප්‍රාදේශීය වෙනස් වීම අධ්‍යයනය කිරීමේ විෂය වේ.
(3) පොලොවතලයේ භූ විද්‍යාත්මක සැකැස්මේ නියතීන් පරීක්ෂා කිරීමේ විෂය වේ.
(4) විෂයේ ප්‍රපංචයන්වල කාලීන හා අවකාශීය වෙනස් වීම සමෝධානිකව අධ්‍යනය කිරීමේ විෂය වේ.
(5) මිනිසා හා පරිසරය අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ භූගෝලීය රටාව අධ්‍යනය කරන විෂය වේ.
(.....)

12. කොන්රඩ් අසන්තතිය දක්නට ලැබෙන්නේ,
(1) සාගරික කලාපයේ වේ.
(2) ගොඩබිම් කලාපයේ වේ.
(3) අධෝගෝල කලාපයේ වේ.
(4) සාගරික මධ්‍ය කලාපවලදී වේ.
(5) ශිලා ගෝලය වෙන්වන අභ්‍යන්තරික කලාපවලදී වේ. (.....)

13. අවසාදිත පාෂාණ පමණක් අඩංගු වරණය වන්නේ,
(1) ග්‍රැනයිට් හා බැසෝල්ට් වේ.
(2) ලුණු හා ගල් අඟුරු වේ.
(3) ඩයොරයිට් හා ඩොලමයිට් වේ.
(4) ක්වාට්සයිට් හා කිරිගරුඩ වේ.
(5) හුණුගල් හා ඩොලරයිට් වේ. (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

14. තැටි භූ කාරක කල්පිතයට අනුව තාප සංවහන ධාරා ආරම්භ වන්නේ,
(1) අධෝගෝලයෙන් වේ. (2) ඉහළ ප්‍රාවරණයෙන් වේ.
(3) පහළ ප්‍රාවරණයෙන් වේ. (4) අභ්‍යන්තර හරයෙන් වේ.
(5) භාහිර හරයෙන් වේ. (.....)

15. දෙවන ගණයේ භූ රූප නිර්මාණය වන ක්‍රියාවලි පමණක් අඩංගු වරණය වන්නේ,
(1) නග්නීකරණය හා ස්ථිතිකරණය වේ. (2) භූ වලන හා යමකම වේ.
(3) බාදනය හා නිධිසාදනය වේ. (4) අන්තජන්‍ය හා බහිර්ජන්‍ය වේ.
(5) උත්පාටනය හා උල්ලේඛනය වේ. (.....)

16. ගංගාවක පාද ගැල්ම ලෙස හඳුන්වන්නේ,
(1) විලක් පාදක කර ගනිමින් ගංගාවක් ගලා යෑම වේ.
(2) වර්ෂාපතනයකින් තොරව ගංගාවක් ගලා යෑම වේ.
(3) තද වැසි මත භූගත ජලය සංතෘප්ත වී ගංගාවක් ගලා යෑම වේ.
(4) පහළ උන්නතාංශයක සිට ඉරුත්වයට ප්‍රතිවිරුද්ධව ගංගාවක් ගැලීම වේ.
(5) පෂ්චිම ගංගා රාශියක් එකම කඳු මුදුනකින් ආරම්භ වී ගංගාවක් ගලා යෑම වේ. (.....)

17. හුණුගල් ආශ්‍රිත විශාලතම භූ රූප ලක්ෂණය වන්නේ,
(1) උවාලා ය. (2) ජොනෝර් ය. (3) හුණුගල් කුළු ය. (4) ලැපිස් ය. (5) පෝල්ජේ ය.
(.....)

18. ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වය මත පෘථිවියේ භූ දර්ශනයට දිගු කාලීනව ඇති කරනු ලබන බලපෑමක් වන්නේ,
(1) අධික වාෂ්පීකරණය මත ලවණීකරණය වැඩි වී වෘක්ෂලතා සෘන්නව අඩු වීම වේ.
(2) විභව වාෂ්පීකරණය නිසා භෞතික පිරිණය ප්‍රභල වී පාෂාණ මතු පිටක් ඇති වීම වේ.
(3) අධිදාවිතය සක්‍රිය වී ජලාශ හා ගංගා නිම්න පතුල් ගොඩවීමයි.
(4) වර්ෂාව හා අධිදාවිතය නිසා භූමියේ අනුක්‍රමණය වෙනස් වීම වේ.
(5) ගංගා ද්‍රෝණිවල රූපකායෙහි වෙනස්කම් ඇති වීමයි. (.....)

19. පෘථිවියේ ගෝලාකාර බව හා අක්ෂාංශගත පිහිටීම නිසා පෘථිවි තලය මත සමකාසන්න ප්‍රදේශවල සිට ධ්‍රැව දෙසට යන්ම ක්‍රමක්‍රමයෙන් උෂ්ණත්වය අඩු වී යෑමේ තත්ත්වය හඳුන්වනුයේ,
(1) පරිසර පතන ශීඝ්‍රතාවය ලෙසයි. (2) වියළි පතන ශීඝ්‍රතාවය ලෙසයි.
(3) ස්ථරතාපී පතන ශීඝ්‍රතාවය ලෙසයි. (4) උෂ්ණත්ව ප්‍රතිලෝමය ලෙසයි.
(5) නිරස් උෂ්ණත්ව ව්‍යාප්තිය ලෙසයි. (.....)

20. සමකයේ සිට දෙපසට 5° අක්ෂාංශගත කලාපය,
(1) සුළං අභිසරණය වන කලාපයකි. (2) සුළං අපසරණය වන කලාපයකි.
(3) වාසුළි බහුලව ඇති වන කලාපයකි. (4) පිළිවාසුළි බහුලව ඇති වන කලාපයකි.
(5) පෙරමුණු වැසි ඇති වන කලාපයකි. (.....)

21. සාමාන්‍ය වර්ෂාපතනයට වඩා විභව වාෂ්පීකරණය අධික වීම, සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 70 mm අඩු වීම යන ලක්ෂණ සහිත දේශගුණ වර්ගය වන්නේ,
(1) A - නිවර්තන දේශගුණ වර්ගය වේ. (2) B - වියළි දේශගුණ වර්ගය වේ.
(3) C - උණුසුම් දේශගුණ වර්ගය වේ. (4) D - ශීත දේශගුණ වර්ගය වේ.
(5) E - ධ්‍රැව දේශගුණ වර්ගය වේ. (.....)

22. ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ පාර්ශවකරුවකු බවට පත් වූ වර්ෂය වූයේ,
(1) 1972 දී වේ. (2) 1981 දී වේ. (3) 1993 දී වේ. (4) 2000 දී වේ. (5) 2006 දී වේ.
(.....)

23. ශ්‍රී ලංකාවේ පිහිටි කැකෙර වනාන්තර පිහිටි ප්‍රදේශයක් වන්නේ,
(1) කිකිළියමාන වේ. (2) කඳපොළ වේ.
(3) අඹේවෙල වේ. (4) හෝටන්තැන්න වේ.
(5) සිංහරාජය වේ. (.....)

24. ශ්‍රී ලංකාවේ අධිදාවිතය අඩු ම ගංගා ද්‍රෝණිය ලෙස සැළකිය හැක්කේ,
(1) කිරිඳි ඔය වේ. (2) මී ඔය වේ.
(3) මහවැලි ගඟ වේ. (4) කළු ගඟ වේ.
(5) මල්වතු ඔය වේ. (.....)

25. එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) සංක්‍රමණික සත්ත්වයන් පිළිබඳ සම්මුතියේ ලේකම් කාර්යාලය පිහිට වූ නගරය වන්නේ,
(1) ජිනීවා වේ. (2) බොන් වේ.
(3) පැරිසිය වේ. (4) ලන්ඩන් වේ.
(5) නවදිල්ලි වේ. (.....)

26. සංවර්ධනය වන රටවල් තුළ ජන සංඛ්‍යාව වඩාත් වේගයෙන් වර්ධනය වීම ආරම්භ වන්නේ,
(1) 1650 න් පසුව වේ. (2) 1750 න් පසුව වේ.
(3) 1850 න් පසුව වේ. (4) 1950 න් පසුව වේ.
(5) 2000 න් පසුව වේ. (.....)

27. ලෝක ජන සංඛ්‍යාව ව්‍යාප්ති මත පෘථිවියේ වැඩි භූමි ප්‍රමාණයක් පවතින්නේ,
(1) ජන ශූන්‍ය ප්‍රදේශ ලෙසයි. (2) ජනාධික ප්‍රදේශ ලෙසයි.
(3) මධ්‍යස්ථ ප්‍රදේශ ලෙසයි. (4) නාගරික ප්‍රදේශ ලෙසයි.
(5) ගැමිරික ප්‍රදේශ ලෙසයි. (.....)

28. ලෝකයේ ජන සංයුතීන්වලට අයත් සාධක පමණක් අඩංගු වරණය වන්නේ,
(1) ආගම් අනුව, ස්ත්‍රී/පුරුෂ බව, භාෂා අනුව වේ.
(2) ස්ත්‍රී/පුරුෂ බව, වයස් බාණ්ඩ, මානව වර්ග වේ.
(3) ග්‍රාමීය/නාගරික බව, භාෂා අනුව, වයස්/බාණ්ඩ වේ.
(4) භාෂා අනුව, මානව වර්ග, ස්ත්‍රී පුරුෂ බව වේ.
(5) මානව වර්ග, ග්‍රාමීය/නාගරික බව, ජන වර්ග වේ. (.....)

29. ප්‍රසාරණ ජන සංඛ්‍යා පිරමීඩයක් සහිත රටක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
(1) වියපත් ජන සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වේ.
(2) ශ්‍රම බලකායේ ආයු අපේක්ෂාව වර්ධනය වේ.
(3) ළමා යැපෙන්නන් ක්‍රමයෙන් අඩු වේ.
(4) ස්වභාවික වර්ධනය ක්‍රමයෙන් අඩු වේ.
(5) ඉහළ වයස් බාණ්ඩ ක්‍රමයෙන් අඩු වේ. (.....)

30. රටක ජන සංඛ්‍යාවක වියපත් වීම පාලනය කිරීම සඳහා ගත හැකි ප්‍රශස්ථ ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) විශ්‍රාම යන වියස් සීමාව ඉහළ නැන්වීමයි.
(2) වියපත් වූවන්ට ස්වයං රැකියා හදුන්වා දීමයි.
(3) උපත් අනුපාතිකය ක්‍රමයෙන් අඩු කිරීමයි.
(4) සාපල්‍යතාවය ක්‍රමයෙන් වධර්නය කිරීමයි.
(5) ආයු අපේක්ෂාව පහළ සීමාවක පවත්වා ගැනීමයි. (.....)

31. දරිද්‍රතාවය ඉහළ මට්ටමක පවතින රටක ජන සංඛ්‍යාවේ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
(1) මුදල් හෝ භාණ්ඩ හිඟකම වේ. (2) පහළ මන්දපෝෂණය වේ.
(3) පහළ ආයු අපේක්ෂාව වේ. (4) ඉහළ ළදරු මරණ වේ.
(5) අසරණභාවය වේ. (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

32. මැතකාලීනව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංක්‍රමණ වර්ධනය වීමට බලපෑ ප්‍රධානතම හේතු සාධකය වන්නේ,
(1) ගෝලීය වසංගත රෝග වේ. (2) ආර්ථික බිඳ වැටීම වේ.
(3) දේශපාලනික බල භුවාමරුව වේ. (4) බලශක්ති අර්බුධ වර්ධනය වේ.
(5) ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක් වීම වේ. (.....)

33. ප්‍රාථමික ආර්ථික කටයුත්තක් වන්නේ,
(1) මැටි භාණ්ඩ නිෂ්පාදනය වේ. (2) මෝටර් රථ කර්මාන්තය වේ.
(3) රාජ්‍ය විධායක නිළධාරී සේවය වේ. (4) ආකර කැණීම වේ.
(5) විජලන ආහාර සැකසීම වේ. (.....)

34. නාගරික වර්ධනය ලෙස හඳුන්වන්නේ,
(1) නාගරික ජන සංඛ්‍යාවේ නිරපේක්ෂ වර්ධනය යි.
(2) ග්‍රාමීය සංක්‍රමණ මත සිදු වන නාගරික වර්ධනය යි.
(3) නගරයක ස්වභාවික වර්ධනය මත සිදු වන නාගරික වර්ධනය යි.
(4) සමස්ත රටේ ජන සංඛ්‍යාවෙන් නාගරික ප්‍රතිශතයේ වර්ධනය යි.
(5) නාගරික සීමා පුළුල් වීම මත සිදු වන නාගරික වර්ධනය යි. (.....)

35. ගෝල්ඩන් බනානා නාගරික කලාපය මගින් සම්බන්ධ වන නගර දෙක වන්නේ,
(1) ඉතාලියේ ජිනෝවා හා එංගලන්තයේ ලන්ඩන් නගරය වේ.
(2) වයඹ දිග එංගලන්තය හා ප්‍රංශයේ පැරිස් නගරය වේ.
(3) ඉතාලියේ ජිනෝවා හා ස්පාඤ්ඤයේ වැලෙන්සියා නගරය වේ.
(4) ප්‍රංශයේ පැරිසි නගරයේ සිට ස්විස්ටලන්තයේ ජිනීවා නගරය වේ.
(5) වයඹදිග එංගලන්තයේ සිට ජර්මනියේ බර්ලින් නගරය දක්වා වේ. (.....)

36. ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන අලවිය සඳහා පිහිට වූ විශේෂ ආර්ථික මධ්‍යස්ථානය පමණක් අඩංගු වරණය වන්නේ,
(1) තඹුත්තේගම, මීගොඩ, වැලිසර (2) දඹුල්ල, වැලිමඩ, කැප්පෙටිපොළ
(3) දඹුල්ල, ඇඹිලිපිටිය, තඹුත්තේගම (4) වැලිසර, නාරාහේන්පිට, වැලිමඩ
(5) බුත්තල, ලුණුගම්වෙහෙර, දඹුල්ල (.....)

37. නිෂ්කර්ෂක කර්මාන්තයක් ලෙස අදහස් කරනුයේ,
(1) ආනයනික අමුද්‍රව්‍ය මත භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය වේ.
(2) දේශීය අමුද්‍රව්‍ය මත භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය වේ.
(3) ආනයනික හා දේශීය අමුද්‍රව්‍ය දෙමුහුන්කරණය මත සිදු කරන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය වේ.
(4) භූමියේ ඛනිජ ද්‍රව්‍ය කැණීම මගින් මතුපිට කැනීමේ ක්‍රියාවලියයි.
(5) අඩු ශ්‍රමය හා වැඩි යාන්ත්‍රීකරණය මත නිර්මාණය වූ නිෂ්පාදන ක්‍රියාවලියයි. (.....)

38. ශ්‍රී ලංකාවෙන් මිනිරන් වැඩිම ප්‍රමාණයක් අපනයන කරන රට වන්නේ,
(1) ඇමරිකා එක්සත් ජනපදය (2) ජපානය
(3) චීනය (4) රුසියාව
(5) ඉන්දියාව (.....)

39. ශ්‍රී ලංකාවේ සංචාරක කලාප අතරින් පුරාණ නගර කලාපයට අයත් සංචාරක නගරයක් වන්නේ කුමක්ද,
(1) කුරුණෑගල. (2) කතරගම. (3) ගාල්ල. (4) හික්කඩුව. (5) රත්නපුර. (.....)

40. වර්තමානයේ දැනට ක්‍රියාව පවතින සාර්ක් සංවිධානය අවසන් වරට රැස් වූ වර්ෂය වන්නේ,
(1) 2006 දී වේ. (2) 2011 දී වේ.
(3) 2014 දී වේ. (4) 2017 දී වේ.
(5) 2021 දී වේ. (.....)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

0831

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2025 (ඔක්තෝබර්)
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2025 (ஒக்டோபர்) / Grade 13 Final Term Test - 2025 (October)

භූගෝල විද්‍යාව	22	S	II

නම
பெயர்
Name ..... විභාග අංකය
சுட்டிலக்கம்
Index No. .....

උපදෙස්:

- II කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය.
- III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50,000 බලංගොඩ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද ප්‍රස්තාර කඩදාසි ද සපයනු ලැබේ.

II කොටස

1) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ බලංගොඩ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි:

- ප්‍රශ්න අංකය සහ අදාළ උප කොටස්වල අංක පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නොවේ.
- සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු නොවේ.

i. A, B, C හා D අක්ෂරය මඟින් දක්වා ඇති භූමි පරිභෝගයන් නම් කරන්න. (ලකුණු 02)

ii. සිතියමේ G හා H අක්ෂර මඟින් දක්වා ඇති චතුරස්‍රයේ පවතින ජලවහන ලක්ෂණ නම් කරන්න. (ලකුණු 02)

iii. සිතියමේ J – K හා L – M අක්ෂර මඟින් දක්වා ඇති බෑවුම් වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

iv. සිතියමේ N – O හා P – Q අක්ෂර මඟින් දක්වා ඇති භූ රූප ලක්ෂණ දෙක නම් කරන්න. (ලකුණු 02)

v. H චතුරස්‍රය තුළ දැක්වෙන ගංගාව 1: 25 000 පරිමාණයට ඇඳ දක්වන්න. (ලකුණු 04)

vi. සිතියමේ දැක්වෙන බලංගොඩ නගරයේ පිහිටීම පිළිබඳ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

vii. සිතියම්ගත ප්‍රදේශයේ මානව කටයුතු සඳහා භූ විෂමතාවය බලපා ඇති ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් විවරණය කරන්න. (ලකුණු 04)

2) සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් මතු සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

- කම්චැට්කා අර්ධද්වීපය
- සිසිලි දූපත
- ලොස් ඇන්ජලීස් නගර
- ආක්ටික් වෘතය
- ඉන්දු ගඟ
- කත්මන්ඩු නගරය
- සහරා කාන්තාරය
- අයර් විල
- Cop 30 සමුළුව පැවැත්වූ රට

2025 වර්ෂයේ මාර්තු මස දරුණු භූමිකම්පනයකට ලක් වූ අග්නිදිග ආසියානු රට (ලකුණු 10)

Scanned with ACE Scanner

3) i. ඉවත් ඡායාරූපයක් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)
ii. ඉවත් ඡායාරූප තාක්ෂණයේ දැකිය හැකි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)
iii. නව සිතියම් විද්‍යාවේ දියුණුව සඳහා දූරස්ථ සන්වේදන තාක්ෂණය මගින් ලැබෙන දායකත්වය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. ආපදා කළමණාකරණ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කර ගැනීමට ඩ්‍රෝන තාක්ෂණය යොදා ගත හැකි ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

4) i. ප්‍රාථමික දත්තයක් යනු කුමක් ද? (ලකුණු 02)
ii. දත්ත රැස් කිරීමේ දී භාවිත වන සම්මුඛ ක්‍රම දෙක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)
iii. කිසියම් අධ්‍යනයක් සඳහා ප්‍රාථමික දත්ත මූලාශ්‍ර මගින් දත්ත රැස් කිරීමේ ප්‍රයෝජන දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. තේමා සිතියම් හා භූ ලක්ෂණ සිතියම් අතර පවතින වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

5) වගු අංක 1හි දක්වා ඇති දත්ත භාවිත කරමින් මතු සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
වගු අංක 1 - 2025 වර්ෂයේ මුල් මාස අට තුළ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව
(ආසන්න වශයෙන් පුද්ගල දහස්)

මාසය	පුද්ගල සංඛ්‍යාව (දහස්)
ජනවාරි	252
පෙබරවාරි	240
මාර්තු	229
අප්‍රේල්	174
මැයි	132
ජුනි	138
ජූලි	200
අගෝස්තු	198
එකතුව	1563

මූලාශ්‍රය - සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) – 2025

i. ඉහත වගු අංක 01හි පවතින දත්ත, සමුහින හා අසමූහින දත්ත වර්ග දෙකෙන් කුමන දත්ත වර්ගයකට අයත් වන්නේ ද? ඊට හේතුව දක්වන්න. (ලකුණු 02)
ii. 2025 වර්ෂයේ මුල් මාස කිහිපයේ සංචාරකයින්ගේ පැමිණීමේ දත්ත වගුව මත
(a) මධ්‍යන්‍යය
(b) සංචාරකයින් පැමිණීමේ මාසික අපගමනය
(c) මධ්‍යන්‍ය අපගමනය
(d) සම්මත අපගමනය ගණනය කර දක්වන්න.

මධ්‍යන්‍ය අපගමනය (MD) $= \Sigma \frac{|x - \bar{x}|}{n}$ සම්මත අපගමන $(\sigma) = \sqrt{\frac{\Sigma(x-x)^2}{n}}$ (ලකුණු 08)

iii. ඉහත 5 (ii) හි ඔබ ගණනය කළ මධ්‍යන්‍ය අපගමනය හා සම්මත අපගමනය ඇසුරින් ශ්‍රී ලංකාවට පළමු මාස කිහිපයේ සංචාරකයින්ගේ පැමිණීම විචලතාවය පිළිබඳ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

Scanned with ACE Scanner

6) වගු අංක 2හි දක්වා ඇති දත්ත භාවිත කරමින් මතු සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගු අංක 02 - පළාත් මට්ටමින් භූමි ප්‍රමාණය හා ජන සංඛ්‍යා ව්‍යාප්තිය - 2023

දිස්ත්‍රික්කය	ජන සංඛ්‍යාව (දහස්)	භූමි ප්‍රමාණය (ව.කි.මී)
බස්නාහිර	6160	3593
මධ්‍යම	2788	5575
දකුණු	2688	5383
උතුර	1175	8290
නැගෙනහිර	1774	9361
වයඹ	2572	7506
උතුරු මැද	1395	9741
ඌව	1405	8335
සබරගමු	2080	4921
මුළු දිවයින	22037	62705

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත වාර්ථාව - 2024

i. වගු අංක 2හි දක්වා ඇති ශ්‍රී ලංකාවේ පළාත් අනුව ජන සංඛ්‍යා හා භූමි ප්‍රමාණය දැක්වීම සඳහා ද්විත්ව තීරු ප්‍රස්ථාරයක් නිර්මාණය කරන්න.(මේ සඳහා සපයා දී ඇති ප්‍රස්තාර කොළය භාවිත කරන්න)
(ලකුණු 07)

ii. ඉහත 5 (ii) හි ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරින් ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා හා භූමි ප්‍රමාණයේ අවකාශීය ව්‍යාප්තිය පිළිබඳ කැපී පෙනෙන ලක්ෂණ හතරක් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

iii. ද්විත්ව තීරු ප්‍රස්තාරික ක්‍රමවේදය මඟින් නිරූපණය කළ හැකි වෙනත් විචල්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

iv. ද්විත්ව තීරු ප්‍රස්තාරික ක්‍රම වේදයේ පවතින වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

28
15
43

Scanned with ACE Scanner

භූගෝල විද්‍යාව - පළමු පත්‍රයේ පිළිතුරු

22	S	I

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	**ප්‍රශ්න අංකය**	පිළිතුරු අංකය	**ප්‍රශ්න අංකය**	පිළිතුරු අංකය	**ප්‍රශ්න අංකය**	පිළිතුරු අංකය
01.	1	11.	4	21.	2	31.	2
02.	2	12.	2	22.	3	32.	2
03.	3	13.	2	23.	1	33.	4
04.	3	14.	1	24.	2	34.	1
05.	4	15.	2	25.	2	35.	3
06.	2	16.	2	26.	4	36.	1
07.	3	17.	5	27.	1	37.	4
08.	5	18.	4	28.	5	38.	2
09.	4	19.	5	29.	2	39.	1
10.	3	20.	1	30.	4	40.	3

01.


i A - වී වගාව B - තේ වගාව c - හේන් වගාව D - වෙනත් වැවිලි (ලකුණු ½ X 04 = 2)

ii G - ගංගා හැඩපළු H - ගං දහර (ලකුණු 01 X 02 = 2)

iii J – K = දළ බෑවුම් L – M = උත්තල බෑවුම (ලකුණු 01 X 02 = 2)

iv N – O = නිම්නය P – Q = නෙරුව (ලකුණු 01 X 02 = 2)

v



vi

- ප්‍රධාන මාර්ගය මැදි කොට නගරය නිර්මාණය වී ඇත.
- උස්භූමි කිහිපයකට මැදිව පවතින පහත් භූමියේ නගරය පිහිටා ඇත.
- ප්‍රධාන අතු ගංගාවක් කේන්ද්‍ර කොට ගෙන ගංගා පිටාර තැනි ප්‍රදේශයක නගරය පිහිටා ඇත.
- කෘෂිකාර්මික භූමි පරිහරණ ප්‍ර දේශයන්ට සීමා වන ලෙස නගරය පිහිටා ඇත. වැනි ලක්ෂණයන් සළකා බලන්න. (ලකුණු 04)

vii


- පටු ගංගා නිමන ප්‍රදේශ ආශ්‍රිතව වැඩි වශයෙන් වී වගා කොට ඇත.
- උස් භූමි ප්‍ර දේශ ආශ්‍රිතව වී වගා කොට ඇත.
- උන්නතාංශය ඉහළ ප්‍රදේශයන් ආශ්‍රිතව වානිජ භෝග වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත.
- ගෙවතු, හේන හා වෙනත් වැවිලි භෝග පහළ උන්නතාංශ මට්ටමේ සිට ඉහළ උන්නතාංශ මට්ටම දක්වා ව්‍යාප්ත වී ඇත.

  වැනි භූ විෂමතාව සමඟ සම්බන්ධ ලක්ෂණයන් දෙකක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

02.



III කොටස

03. . i ගුවන් ඡායාරූපයක් යනු ගුවනේ සිට නිශ්චිත පියාසර සැළසුමකට අනුව නිශ්චිත පරිමාණයකින් යුක්ත ව භූමියෙහි කිසියම් තෝරා ගත් කොටසක් ආවරණය වන පරිදි ලබා ගන්නා සැබෑ ඡායාරූපයකි.

(ලකුණු 02)

ii

- නිශ්චිත පියාසර සැළසුමකට අනුව ලබා ගනී.
- නිශ්චිත පරිමාණයකට අනුව ලබා ගනී
- භූමියෙහි තොරා ගත ප්‍රදේශයක දත්ත ලබා ගනී.
- පෘථිවියේ යථා භූ දර්ශනයේ අනුරූපයකි.
- අතිච්ඡාදනය වන ආකාරයෙන් ලබා ගන්නා ඡායාරූපයකි.
- ලබා ගන්නා කෝණය අනුව සිරස් හා ඇළ ගුවන් ඡායාරූප වර්ග දෙකකි.

(ලකුණු 02 X 02 = ලකුණු 04)

iii

- මිනිසාට ලගා වීමට නොහැකි ප්‍රදේශවල දත්ත ලබා ගත හැක වීම.
- කාර්යක්ෂමව දත්ත ලබා ගැනීමට හැකි වීම.
- විශාල දත්ත ප්‍රමාණයක් එකවර ලබා ගැනීමේ පහසුව.
- යාවත්කාලීන වූ දත්ත ලබා ගැනීමට හැකි වීම.
- කාලීන හා අවකාශීය වශයෙන් සිදු වන වෙනස්කම් පහසුවෙන් හදුනාගැනීමට හැකි වීම.

(ලකුණු 02 X 02 = ලකුණු 04)

iv.

- අවදානම් සහිත ප්‍රදේශ නිරීක්ෂණය හා දත්ත ලබා ගැනීමේ කටයුතු සඳහා
- ආපදාවලට ලක්වූවන් හඳුනා ගැනීම, ආරක්ෂිතව මුදවා ගැනීම වැනි කටයුතු සඳහා
- ආපදා අවස්ථාවල දී හා ලගා වීමට අපහසු ස්ථානවලට භාණ්ඩ ප්‍රවාහනය සඳහා
- ආපදාවන්වල සජීව අධ්‍යයනයන් හා විකාශනයන කටයුතු සඳහා
- අපදා හානි තක්සේරු හා අවම කිරීම් කටයුතු සඳහා

(ලකුණු 02 1/2 X 02 = ලකුණු 05)

04. i යම්කිසි අරමුණක් අරඹයා මුල් වශයෙන් කෙරෙන පරීක්ෂණයක් වැනි කුමයකින් එම අරමුණට අදාළ ව මුල් වශයෙන් රැස් කරනු ලබන දත්ත වේ. පර්යේෂකයා විසින් ක්ෂේත්‍රයට ගොස් දත්ත රැස් කිරීම එහි විශේෂ ලක්ෂණයකි. (ලකුණු 02)

ii ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා යන සමීක්ෂණ දෙක විස්තර කළ යුතු වේ.

(ලකුණු 02 X 02 = ලකුණු 04)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

iii

- අධ්‍යයන ක්ෂේත්‍රය ඉතා හොඳින් අවබෝධ කර ගත හැකි වීම.
- පර්යේෂණයට අදාළම දත්ත සෘජුවම ලබා ගත හැකි වීම.
- අධ්‍යයනයට අදාළ නවතම දත්ත ලබා ගත හැකි වීම
- පර්යේෂණය ගැඹුරින් අධ්‍යනය කළ හැකි වීම
- අධ්‍යනයට අදාළ ගුණාත්මක හා විශ්වසනීය දත්ත ලබා ගත හැකි වීම.
- අධ්‍යන ක්ෂේත්‍රය තුළ පවතින නව පර්යේෂණයන් මතු කර ගත හැකි වීම

(ලකුණු 02 X 02 = ලකුණු 04)

iv.

තේමා සිතියම්	භූ ලක්ෂණ සිතියම්
එක් සුවිශේෂී තේමාවක් මත පදනම් වේ	සිතියම් ගත ප්‍ර දේශයට අදාළ සිතියමකින් දැකිවිය හැකි හැකි තාක් ලක්ෂණ අඩංගු වේ
නිර්මාණය කරන්නා මත වර්ණ, සංකේත අක්ෂර වෙනස් වේ.	සම්මත පිළිගැනීමක් සහිත් සුවකයක් මත නිර්මාණය වේ.
ප්‍රමාණයෙන් කුඩා සිතියමකි.	සාපේක්ෂව විශාල සිතියමකි.
නිරූපණ වන සිතියමේ තේමාව අනුව මාතෘකාව තරණය වේ.	සිතියම් ශ්‍රේණිය මත සිතියමේ මාතෘකාව තීරණය වේ.
බොහෝ විට සරළ සිතියම් ආකෘතියක් ඇත.	සාපේක්ෂව සංකීර්ණ සිතියම් ආකෘතියක් ඇත.

(ලකුණු 02 1/2 X 02 = ලකුණු 05)

05. i දී ඇති දත්ත අසමූහිත දත්තවලුවකි.

එහේතු සාධකය - එම දත්ත බාණ්ඩ කිරීමකට හෙවත් පන්ති ප්‍රාන්තර ලෙස සකස් කොට නොමැති අතර ඒවා රැස් කර ගන්නා මූලික ස්වරූපයෙන් පවතී. (ලකුණු 02)

ii

		ii (a)	**ii** (b)	
මාසය	X (පුද්ගල සංඛ්‍යාව - දහස්)	- X	$(x-\bar{x})$	$(x-\bar{x})^2$
ජනවාරි	252	195.37	56.63	3206.95
පෙබරවාරී	240		44.63	1991.83
මාර්තු	229		33.63	1130.97
අප්‍රේල්	174		-21.37	456.67
මැයි	132		-63.37	4015.75
ජුනි	138		-57.37	3291.31
ජූලි	200		4.63	21.43
අගෝස්තු	198		2.63	6.91
එකතුව	1563		284.26	14121.82

මූලාශ්‍රය - සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

සැ.යු. දශමස්ථාන එකක් ලබා ගෙන ගණන සාදා ඇත්නම් ඒ මත සළකා බලා ලකුණු ලබා දෙන්න.

(c) මධ්‍යන්‍ය අපගමනය

$= \sum \frac{|x-\bar{x}|}{n}$

= 284.26 / 8

= 35.5

(b) සම්මත අපගමනය

$\sigma = \sqrt{\frac{\sum(x-\bar{x})^2}{n}}$

= 14121.82/8

= 1765.22

= 42.01

ලකුණු වෙන් කිරීම


(a) ලකුණු 02
(b) ලකුණු 02
(c) ලකුණු 02
(D) ලකුණු 02

(ලකුණු 08)

iii ශ්‍රී ලංකාවට පළමු මාස කිහිපයේ මාසිකව සංචාරකයින්ගේ සාමාන්‍ය පැමිණීම 195000ක් පමණ වේ. මාසිකව එය වෙනස් වීමට හැකි සාමන්‍ය වන්නේ 35500ක් වැනි ප්‍රමාණයකි. නමුත් එය සම්මත අපගමනය තුළින් 42010 ක මාසික විචලතාවයක් දක්වයි. (ලකුණු 05)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

6 (i)


විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම තහනම්. பரீட்சை மண்டபத்துக்கு வெளியே எடுத்துச் செல்லலாகாது. Not to be removed from the Examination Hall.
භූමි ප්‍රමාණය (හෙ. නි. මී.)
0
3500
4500
5500
6500
7500
8500
9500
10500
1000
2000
3000
4000
5000
6000
7000
8000

6 i ලකුණු වෙන් කිරීම

මාතෘකාව	- ලකුණු 1/2
මූලාශ්‍රය	- ලකුණු 1/2
සිරස් රේඛාව දෙකට	- ලකුණු 01
සිරස් පරිමාණය දැක්වීමට	- ලකුණු 1/2
සූචකය	- ලකුණු 1/2
නිවරදි බව	- ලකුණු 04
මුළු ලකුණු	**- ලකුණු 07**

ii ප්‍රස්ථාරය ඇසුරින් සිසුවා දක්වා ඇති නිවැරදි කරුණු හතරක් කෙටි විස්තර සහිතව දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (කරුණුකට ලකුණු 01 බැගින් ලකුණු 04)

iii

- වර්ෂ හෝ ප්‍රදේශ කිහිපයක ආනයන - අපනයනය
- වර්ෂ හෝ ප්‍රදේශ කිහිපයක ස්ත්‍රී - පුරුෂ ජන සංඛ්‍යාව
- වර්ෂ හෝ ප්‍ර දේශ කිහිපයක කිසියම් විභාගයක සමත් වැනි එකිනෙක පත යැපෙන විචිත්‍ර ඔනෑම දත්තය යුගලයක් නිවැරදි වේ. (කරුණුකට ලකුණු 01 බැගින් ලකුණු 02)

iv

- යුගල් වශයෙන් පවතින විචළ්‍යක කාලීන හෝ අවකාශීය වෙනස් වීම අධ්‍යනය කළ හැකි ය.
- එක් එක් තීරු අතර වෙනස්කම් සංසන්දනය කළ හැකි ය.
- තීරු අතර වෙනස්කම් සංසන්දනය කළ හැකි වීම.(වාසියකට ලකුණු 01 බැගින් ලකුණු 02)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

භූගෝල විද්‍යාව - දෙවන පත්‍රයේ පිළිතුරු

22	S	II

01 i නිම්න කඳු ගැසියර් - උදාහරණ ඇල්ප්ස්, රොකි, එවරස්ට්, ඇට්ලස්
මහත්වීපික / ධ්‍රැව ග්ලැසියර් - ග්‍රීන්ලන්තය, අයිස්ලන්තය, සයිබීරියාව (ලකුණු 02)

ii උත්පාටනය - පාෂාණ කුට්ටි ගැලවී යාම.
උල්ලේඛනය - ඔපමට්ටම් වීම
පිරිසැරීම - ග්ලැසියරයේ බර හා තෙරපුමක් හේතුවෙන් අතුගෑවෙන්නාක් සේ ඉවත් කර දැමීම.
විස්තර විය යුතුය. (ලකුණු 2 X 3 = ලකුණු ලකුණු 6)

iii නිම්න කඳු ගැසියර් - සර්ක, අරේට, ගිරිවිල්, පිරමීඩාකාර කඳු, U හැඩැති නිම්න, ලම්භ නිම්න.
මහත්වීපික / ධ්‍රැව ග්ලැසියර් - රොෂ්මුටෙන්නේ, විෂම ප්‍රාන්ත හේල්, නූනටැක්ස්, ෆියෝඩ වෙරළ
(නම් කිරීමට -ලකුණු ½ , විස්තර කිරීමට - ලකුණු 1, රූප සටහනට ලකුණු ½ - ලකුණු 2 X 3 = ලකුණු 6)

iv

- සංචාරක කර්මන්දයට පදනම් වීම.
- අකුරු මැටි ප්‍රදේශය කෘෂිකර්මාන්තයට භාවිතා කර හැකි වීම.
- ජල මාර්ග ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කළ හැකි වීම (උදාහරණ සමඟ විස්තර කළ යුතුය)

02

i කිසියම් ස්ථානයක කිසියම් වේලාවක පවතින වායුගෝලීය තත්ත්වය කාලගුණය වන අතර කිසියම් භූගෝලීය ප්‍රදේශයකට අදාළව වායු ගෝලයේ දීර්ඝ කාලයක් තුළ පවතින කාලගුණික මූලිකාංගයන්ගේ සාමාන්‍ය කරන ලද තත්ත්වය දේශගුණය වේ.(ලකුණු 02)

ii

<u>01 නිවාර්තා දේශගුණය</u>

ලක්ෂණ

- වසර පුරා 18^0C ඉක්මවන ඒකාකාරී ඉහළ උෂ්ණත්වයක් පැවතීම.
- වාර්ෂික වර්ෂාපතනය 3000mm ඉක්මවන වසර පුරා පැතිරී පවතින වර්ෂාපතනය ලැබීම.
- කැපී පෙනෙන වියළි ඍතුවක් නැත.

ව්‍යාප්තිය

ඇමර්සන් ද්‍රෝණිය, කොන්ගෝ ද්‍රෝණිය, බටහිර ඉන්දීය දූපත්, නැගෙනහිර මැඩගස්කරය, නැගෙනහිර බ්‍රසීලය, ගායනාව

02 නිවර්තන මෝසම් දේශගුණය

ලක්ෂණ

- වසර පුරා පවතින 18^0C ඉක්මන උෂ්ණත්වයක් පැවතීම.
- මෝසම් ඍතුවේ අධික වර්ෂාපතනයක් ලැබීම.
- කෙටි වියළි ඍතුවක් පැවතීම.
- වාෂ්පීකරණය ඉක්මවන වර්ෂාපතනය හේතුවෙන් ජල අතිරික්තයක් පැවතීම.

ව්‍යාප්තිය

- ඉන්දුනීසියාවේ නිරිතදිග හි බටහිර වෙරළ
- ශ්‍රී ලංකාවේ තෙත් කලාපය.
- නිව්ගීනියාවේ බටහිර තුඩුව.
- ඉන්දුනීසියාවේ බෝර්නියෝ දූපත්.
- අප්‍රිකාවේ සියරිලියොන් හා ලයිබීරියාව.

03 නිවර්තන තෙත් වියළි දේශගුණය

ලක්ෂණ

- ශීත ඍතුව වියළි තත්ත්වයක් පැවතීම.
- වර්ෂාපතනය අඩු ය.
- වාර්ෂික වර්ෂාපතනය 600mm අඩු ය.
- තෙත් හා වියළි ඍතුවක් ඇත.
- නිවර්තන සැවානා වනාන්තර පවතී.

ව්‍යාප්තිය

- මධ්‍යම අප්‍රිකාව
- ඉන්දියාවේ ඩෙකැන් සානුව
- මියැන්මාරය
- තායිලන්තය
- ඔස්ට්‍රේලියාවේ උතුරු වෙරළ
- මැඩගස්කරයේ වයඹදිග වෙරළ
- කැරිබියන් දූපත්

වර්ග දෙකක ලක්ෂණ හා ව්‍යාප්තිය විස්තර කළ යුතු ය. (ලකුණු 3 X 2 = ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

iii

- මෝසම් වර්ෂාව (ඊසාන හා නිරිත දිග)
- සංවහන වර්ෂාව
- වාසුළි වර්ෂාව

ලක්ෂණ, ලැබෙන ප්‍ර දේශ, කාලය විස්තර කළ යුතු ය. (නම් කිරීමට -ලකුණු 03 , විස්තර කිරීමට - ලකුණු 03 = ලකුණු 6)

iv

- වර්ෂා ජලයෙන් වගා කිරීම.
- ගංවතුර හේතුවෙන් වගා බිම් විනාශ වීම.
- නියඟය මඟින් වගාබිම් විනාශ වීම.
  (කරුණු 02ක් මගින් යහපත් හා අයහපත් බලපෑම් විස්තර විය යුතු ය.)
  (ලකුණු 03 X 2 = ලකුණු 6)

03 i

- නිවර්තන වර්ෂා වනාන්තර
- සෞම්‍ය කලාපීය වනාන්තර
- මධ්‍යධණීය වන ලැහැබ්
- තෘණබිම් හා සැවානා
- කාන්තාර
- තුන්ද්‍රා (ලකුණු 1/2 X 4 = ලකුණු 2)

ii නම් කරන ලද බියෝමයේ ව්‍යාප්තිය, දේශගුණය, වෘක්ෂලතාවල ලක්ෂණ, ශාක හා සත්ත්ව විශේෂ විස්තර විය යුතු ය. (13 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශනයේ පිටු අංක 29 – 35)

වර්ග දෙකක ලක්ෂණ හා ව්‍යාප්තිය විස්තර කළ යුතු ය. (ලකුණු 3 X 2 = ලකුණු 6)

iii

- ලංකාවේ තාණ බිම් දේශගුණය හා ප්‍රා දේශීය විෂමතාවය පදනම් කරගෙන වර්ග කර ඇත.
- තෙත් පදන බිම් (මුහුදු මට්ටමේ සිට 2000m වැඩි ප්‍ර දේශවල,
- වියළි පතන - 500m – 1000m අතර ප්‍රදේශවල
- දමන /තලාව - ගල්ඔය, මාදුරුඔය, ප්‍ර දේශවල
- විල්ලු - සෝමාවතිය, මනම්පිටිය . . . .
- වෘක්ෂලතාවල ස්වභාවය, දේශගුණ ව්‍යාප්තිය, විස්තර කළ යුතු ය. (ලකුණු 6)

iv

- විශාල වශයෙන් සිදු න වන හායනය.
- ජනාවාස පිහිටු වීම
- සංවර්ධන ව්‍යාපෘති
- ජාන මංකොල්ලය
- තෙත් බිම් හා කඩොලාන බිම් ව්‍යාප්තිය. (ලකුණු 03 X 2 = ලකුණු 6)

04 i ස්වභාවික ක්‍රියාවලි හේතුවෙන් ප්‍රජාවට හෝ දේපළවලට හා පරිසරයට හානියක් සිදු විය හැකි සංසිද්ධිය උපද්‍රවයක් වන අතර උපද්‍රවයක් මිනිස් ජීවිත දේපළවලට හා පරිසරයට හානි සිදු වන අයුරින් සක්‍රීය වීම ආපදාවක් වේ. (ලකුණු 2)


ii

- භූමි කම්පා
- ගිණිකඳු
- නායයෑම්
- සුනාමි දෙකක් උදාරණ මඟින් විස්තර කළ යුතු ය. (ලකුණු 3 X 2 = ලකුණු 6)

iii

- අක්‍රමවත් ඉඩම් පරිහරණය.
- අවිධිමත් ඉදි කිරීම්.
- කාර්මීකරණය.
- වනහරණය (ලකුණු 2 X 3 = ලකුණු 6)

iv



මෙහි එක් අවස්ථාවක් උදාහරණ දෙකක් භාවිත කොට විස්තරකළ යුතු ය.
(ලකුණු 03 X 2 = ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

05 i

- ස්වභාවික වර්ධන වේගය 1% ට වඩා පහළ අගයක් ගැනීම.
- සුළු උච්ඡාවචනය වෙමින් ස්ථාවර වර්ධනය වන තත්ත්වයක් පවතී.
- ස්වභාවික වර්ධනය ඉතා පහළ අගයක් ගැනීම.
- ස්වභාවික වර්ධනය ධන අගයකින් තව දුරටත් වර්ධනය වීම
- ප්‍රමාණාත්මක ජන සංඛ්‍යාව කාලානුරූප වර්ධනය වීම..... ආදී වශයෙන් ජන සංඛ්‍යාවේ වර්ධනය මත දක්වන කරුණු මත ලකුණු ලබා දෙන්න.

(ලකුණු 1 X 2 = ලකුණු 2)

ii

- ස්වභාවික වර්ධන වේගය 1% ට වඩා පහළ අගයක් ගැනීම.
  - ✓ සාපල්‍යතාවය අඩු වීම.
  - ✓ උපත්පාලන ක්‍රම ප්‍රචලිත වීම.
  - ✓ කුඩා පවුල් ඒකක අගය කිරීම.
- සුළු උච්ඡාවචනය වෙමින් ස්ථාවර වර්ධනය වන තත්ත්වයක් පවතී.
  - ✓ උපත් පාලනය මත සැළසුම්ගත ජන සංඛ්‍යා වර්ධනයට යොමු වීම
  - ✓ රජය මැදිහත්ව උපත් පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
  - ✓ සමාජයේ කුඩා පවුල් ඒකක අගය කිරීම.

වැනි සිසුන් දක්වන කරුණුවලට අදාළව දක්වන හේතු සළකා බලා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2 X 3 = ලකුණු 6)

iii

- ජන සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩි වීම.
- 2007 වර්ෂයේ පසුව ජන සංඛ්‍යාව මිලියන 20 ඉක්මවා ඇත.
- 2000 වර්ෂයේ සිට 2011 වන විට මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවේ මිලියන 1.74 කින් වර්ධනය වී ඇත.

  වැනි මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව මත දක්වන ලක්ඛණ තුනක් විස්තර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 X 3 = ලකුණු 6)

iv

- ජන සංඛ්‍යාව වියපත් වීම.
- ශ්‍රම බලකාය හැකලීම අවදානම් හට ගැනීම.
- ජන සංඛ්‍යා වර්ධනය හායනය වීමේ අවදානමක් ඇති වීම. (ලකුණු 2 X 3 = ලකුණු 6)

06 i

- මිනිසා
- සමාජය
- පරිසරය
- ආවරණය
- ජාල (ලකුණු 1/2 X 4 = ලකුණු 2)

ii

- නාගරික ජන සංඛ්‍යාවේ ස්වභාවික වර්ධනය ඉහළ අගයක් ගැනීම.
- ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවල සංක්‍රමණය සිදු වීම.
- නාගරික සීමා පුළුල් කිරීම. (ලකුණු 2 X 3 = ලකුණු 6)

iii

- නිවාස හිඟය හා පැල්පත් මුඩුක්කු බිහි වීම.
- සමාජ විරෝධී ක්‍රියා බහුල වීම.
- අධික මාර්ග තදබදය හා රිය අනතුරු ඉහළ යෑම.
- පරිසර දූෂණය ඉහළ පැවතීම
- වසංගත රෝග ව්‍යාප්ය ඉහළ යෑම(ලකුණු 2 X 3 = ලකුණු 6)

iv දෙන ලද ජනාවාසවල ලක්ෂණයන් නිැරදි නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 X 3 = ලකුණු 6)

07 I අමුද්‍රව්‍ය නිමිද්‍රව්‍ය බවට පත් කිරීමේ ක්‍රියාවලියයි. මෙහි දී අමුද්‍රව්‍යක් හෝ කිහිපයක් සම්මිශ්‍රණය කර වැඩි වටිනාකමක් ලබා දෙන නිෂ්පාදනයක් සිදු කරයි. (ලකුණු 2)

ii

- සිමෙන්ති
- සීනි
- ඇඟලුම්,
- ප්ලාස්ටික් හා රබර්
- සාම්ප්‍රදායකි හස්ත කර්මාන්ත යන ශ්‍රී ලංකාවේ කර්මාන්ත ස්ථානගත වීමට බලපාන අමුද්‍රව්‍ය, ශ්‍රමය, ප්‍රවාහනය. . . . . වැනි සාධක විස්තර කොට ඇත්නම් ළකුණු ලබා දෙන්න.
(ලකුණු 2 X 3 = ලකුණු 6)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

iii

- අමුද්‍රව්‍ය හිඟ වීම හා මිළ ඉහළ යෑම
- නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම නිසා ලැබෙන ලාභය අඩු වී යාම.
- ශ්‍රම හිඟය හා ඒ ආශ්‍රිත ගැටලු
- ආදේශක ආනයනය කිරීම.
- ගෝලීය ආර්ථික අර්බුධ හේතුවෙන් අපනයනය සීමා වීම.
  උදාහරණ සහිතව දක්වා තිබෙනම් ලකුණු දෙන්න (ලකුණු 2 X 3 = ලකුණු 6)

iv

- තනි පුද්ගල කර්මාන්ත වෙනුවට සාමූහික සමාගම් හා බහු ජාතික සමාගම් කර්මාන්ත ස්ථානගත කිරීමේ ව්‍යවසායක්යන් ලෙස කටයුතු කිරීම.
- පරිසර හිතකාමීව කර්මාන්ත ස්ථාගත කිරීමට පෙළඹීම.
- විශ්ව විද්‍යාල,පර්යේෂණ ආයතන මුල් කර ගනිමින් අධි තාක්ෂණික කර්මාන්ත ස්ථානගත වීම.
- කර්මාන්ත ස්ථානගත වීමේ දී තොරතුරු තාක්ෂණය බලපෑම වැඩි වීම.

(ලකුණු 2 X 3 = ලකුණු 6)

08

I

- කොළඹ නගර
- දකුණු වෙරළ
- උස්බිම් ප්‍රදේශය
- මහ කොළඹ
- නැගෙනහිර වෙරළ
- පුරාතන නගරය
- උතුරු ප්‍රදේශය (ලකුණු 1/2 X 4 = ලකුණු 2)

ii

- දේශීය අනන්‍යතාවය සහිත පැරණි සංස්කෘතික අංග
- ශ්‍රී ලංකාවේ ඇති ආගමික හා සංස්කෘතික වටිනාකම් (උදා දළදා පෙරහැර)
- උසස් තත්ත්වයේ ආගන්තුක සත්කාර
  ශ්‍රී ලංකාවේ ඇති ආහාර සංස්කෘතිය... වැනි කරුණු විස්තර කළ යුතු ය. (ලකුණු 2 X 3 = ලකුණු 6)

iii

- විදේශ විනිමය උපයා ගැනීම.
- රටේ දළ ජාතික නිෂ්පාදනයට දායක වීම.
- ග්‍රාමීය සංවර්ධනය (ප්‍රාදේශීය) සංවර්ධනය ඇති වීම.
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම.

(ලකුණු 2 X 3 = ලකුණු 6)

iv

- සංචාරක කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම
- සංචාරකයාගේ ආරක්ෂාව තහවුරු වන පරිසරයක් ගොඩ නැගීම.
- සංචාරක කර්මාන්තය තුළ නව ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම.
- දේශී කර්මාන්ත ප්‍රවර්ධනයට අනුබල දීම.
- විවිධ රටවල සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ලකුණු 2 X 3 = ලකුණු 6)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!